# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1829/26 - 2013 සැප්තැම්බර් මස 24 වැනි අඟහරුවාදා - 2013.09.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත

14 වැනි වගන්තිය යටතේ නියෝග

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය රිෂාඩ් බදියුදීන් වන මම, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයාගේ ද එකඟත්වය ඇතිව, 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 (1) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මෙම පනතේ 14(1) වගන්තිය මගින් නිකුත් කරන ලද 2012.11.08 වැනි දිනැති අංක 1783/20 දරන අති විශෙෂ ගැසට් නිවේදනයෙහි (I) තීරුවෙහි දක්වා ඇති සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ යටතේ තෝරා ගත් භාණ්ඩ සඳහා (IV) වැනි තීරුවේ සඳහන් පරිදි පනවා ඇති සෙස් බද්ද, මෙහි සඳහන් උපලේඛනයෙහි (II) වැනි හා (III) වැනි තීරුවල නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ අපනයනය කිරීම මත, (IV) වැනි තීරුවේ දක්වා ඇති පරිදි නැවතෙක් නොමිලේ (F.O.B) වටිනාකමින් හෝ අදාළ අපනයන සම්බන්ධයෙන් දක්වා ඇති විශේෂ අනුපාත පරිදි ගණනය කළ යුතු වන්නා වූ සෙස් බද්දක් 2013 සැප්තැම්බර් මස 25 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නියම කොට අය කළ යුතු බව මෙම නියෝගය මගින් ප්‍රකාශයට පත් කරමි.

රිෂාඩ් බදියුදීන්,
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය.

2013 සැප්තැම්බර් මස 24 වැනි දින,
කොළඹ,
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ දී ය.

උපලේඛනය

| ශීර්ෂ අංකය (I) | සංයෝජිත වර්ගීකරණ සංකේතය (II) | | විස්තරය (III) | සෙස් බදු ප්‍රමාණය (IV) |
|---|---|---|---|---|
| 25.05 | | | පරිච්ඡේද අංක 26 යටතෙ වැටෙන ලෝහ හරිත වැලි වර්ග හැර, වර්ණ කළ හෝ නොකළ සියලුම වර්ගවල ස්වාභාවික වැලි. | |
| | | | | |
| | 2505.10 | - | සිලිකා වැලි සහ තිරුවානා වැලි : | |
| | 2505.10.10 | --- | ඉවතලන | මෙ.ටො. එකකට රු.1,250/- |
| | 2505.10.90 | --- | අනෙකුත් | මෙ.ටො. එකකට රු.1,250/- |
| | 2505.90 | - | අනෙකුත් - කෙයොලින් හෝ පෙල්ස්පාර් වැලි අඩංගු මැටි වැලි | මෙ.ටො. එකකට රු.5,000/- |

10 - 338


1A - PG 1762 — 800 (2013/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*